

**‘මා නිවත්ත අභික්කම’ – නො නැවත ඉදිරියට යවු**

| | | |
|---|---|---|
| **57 වන කාණ්ඩය** | **බු.ව. 2558 පොසොන් මස පුරපසළොස්වක ද ක්‍රි.ව. 2014 ජුනි මස 12 වන ද** | **02 වන කලබ** |



# වඳිමු මිහිඳු හිමිඳුන් සිරිපා කමල

මෙ ලක්දිව දනට හිත සුව සඳහා ම
පසක් කළ දහම සිය දිවි නො තකා ම
පසක් කරවූහ දන හට කැර පේම
නොවක් බැතින් නමඳිමු හිමි හැමද ම

අවිදු මිස`ඳුරෙහි හුන් අප හෙළ දනට
සුමුදු මෙත් සිතින් පා යහ මඟ සොඳට
පුබුදු කළ දැය ම සපුරා හැම ලෙසට
මිහිඳු හිමිඳු ගුණ සමරමු හැම කලට

**– අනඳ**

02 වන කොටස

# වර්තමාන ලෝකයට බුදු දහම පහදා දෙන්නකු ගේ මතක සටහන්

අනගාරික ධර්මපාලතුමා විසිනි
(''ධර්මපාල ප්‍රතිරාවය'' කෘතියෙනි)



මගේ මුල් කාලයේ දී මා ලබා තිබුණු බෞද්ධ පුහුණුව නිසා, මායා සහගත සුඛයන් ගෙන් පිරි ලෝකය, සෑම අන්දමක ම දුක්ඛාපදාවලින් හා වේදනාවලින් යුක්ත තාවකාලික නතර වීම් ස්ථානයක් ලෙස මට වැටහී තිබිණ. මගේ මේ අදහස, මගේ වයස අවුරුදු දහ හත වන විට ස්ථීර වී ය. අවුරුදු දෙකක් වත් නො වූ මගේ බිලිඳු නංගී, සෞඛ්‍යයෙන් හා ක්‍රීඩාශීලී ගතියෙන් පිරී ඉතිරෙමින් සිටියා ය. හදිසියේ ම අසනීප වූ ඈ ඊට පසු දින මිය ගියා ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මගේ මව අතිශයින් ශෝකී දුක්බර තත්ත්වයකට පත් වූවා

ය. මගේ ආදරණීය නංගී ගේ අභාවය නිසා මගේ මව හඬනු දුටු මට, ජීවිතය ඉතා දුක්බර එකක් යැයි සිතිණි. වයස අවුරුදු දහ හතක් වූ මම, කිසි කලෙක ගැහැණියක ගේ ශෝකයට හේතුවක් නොවන්නට තීරණය කර ගතිමි. ලෝක ආස්වාදය නමැති දැලෙහි නොපැටලැවෙන්නට මම සිත හදා ගතිමි. එ තැන් පටන් මම අනුන් ගේ හිත සුව පිණිස මගේ ජීවිතය කැප කරන්නට උත්සාහ ගතිමි. මගේ මේ අධිෂ්ඨානය හරියට ම කෙසේ ක්‍රියාත්මක කළ යුතු දැයි මට නිශ්චිත දැනීමක් නොතිබුණේ ය. කෙසේ හෝ වේවා, බ්ලැවට්ස්කි මැතිනිය ගේ ලිපිවලින් මට මාර්ගයක් උදා වන බව මට හැඟිණි.

වයස අවුරුදු දහ අටේ දී මම පාසලින් අස් වූවෙමි. ඉක්බිති ව කලක් නිවෙසෙහි නතර වී සිටි මම, මගේ පියා ගේ ව්‍යාපාරික ස්ථානය ඉදිරි පිට වූ පිටකොටුවේ පුස්තකාලයෙන් පත් පොත් ඉමහත් වේගයකින් කියවන්නට වීමි. මම සෑම දෙයක ම ආචාර ධර්මය, දර්ශනය, මනෝ විද්‍යාව, කලා ශිල්ප, විශේෂයෙන් චරිත කථා හා ඉතිහාසය ආදි සෑම දෙයක් ම කියවීමි. මම ඉංග්‍රීසි කවීන් බොහෝ දෙනෙකුන් ගේ කවි කියවීමි. එහෙත් සෑම විට ම මා ප්‍රිය කළේ පාසලේ දී මා අතිශයින් ආදරය කළ ශෙලී නමැති කවියා ය. මට ඔහු ගේ පරණ කවි පොතක් මගේ මාමා ගේ නිවෙසේ තිබී හමු වූයෙන් මම මායාවී ලෝකවලට ගමන් ගත්තෙමි. වයස අවුරුදු දෙළහේ දී මා මගේ ප්‍රියතම කාව්‍යය වශයෙන් සැලකුවේ,,මැබ් ඒඉ, ය. මිනිසා තමා මත පටවා ගන්නා කෲර කම් හා අසාධාරණ කම් ගැන එහි වූ කාව්‍යමය කෝපයටත් පෞද්ගලික නිදහස වෙනුවෙන්

එහි වූ දැඩි ආසාවටත් මගේ ඇල්ම කිසි කලෙක තුරන් වූයේ නැත. මිනිසාට තමා ගේ ම යත්නයෙන් ආධ්‍යාත්මික සුවයේ ඉහළ තලවලට යා හැකි යැ යි එහි දක්වෙන සිද්ධාන්ත නිසා, කල්පනාකාරී බෞද්ධ දරුවකුට ූමැබ ඒඉ, විශේෂයෙන් ම ප්‍රිය වූයේ ය. ශෙලී ඇත්ත වශයෙන් ම තාරුණ්‍යයේ කවියෙකි. මම දැනුදු ශෙලීට ප්‍රිය කරමි.

කෙළවරක් නොමැති ව පැ ගණන් පුස්තකාලයේ මා ගත කිරීම ගැන මගේ පියා කැමති වූයේ නැත. සාමාන්‍ය අර්ථයෙන් බලන කල මා කිසි ම දෙයක් කළේ නැත - මා කළේ කියවීමත් කල්පනා කිරීමත් පරම විඥානාර්ථීන් අධ්‍යයනය කිරීමත් පමණි. පරම විඥානාර්ථීන් බටහිර ලෝකයට බුද්ධාගම කියා දෙන්නන් ලෙස මම සැලකීමි. එසේ වුව ද, ඔවුන් ගේ ක්‍රියාවන්ට ඉතා ම කැමැත්තෙන් සිටිය ද, මට රක්ෂාවක් කිරීමට කාලය පැමිණ ඇතැ යි මගේ පියා සිතුවේ ය. ඔහු මට මෙසේ කිවේ ය. ''උඹ මොකක් හරි ප්‍රයෝජනවත් දෙයක් කරපන්. කොළඹ රජයේ දෙපාර්තමේන්තුවකට බැඳියන්. එහෙම බැඳිලා උඹට ප්‍රායෝගික වෙන්න පුළුවන් ද කියලා බලපන්.''

මම අධ්‍යාපන දෙපාර්තමේන්තුවට බැඳුණෙමි. මගේ පෑන් හරඹය අගය කළ එහි අධ්‍යක්ෂ, ඔහු ගේ විශේෂ වාර්තා සියල්ල ම පිටපත් කිරීමට මට බාර කළේ ය. ඒ යතුරු ලියනය භාවිතයට පැමිණ නොතිබුණ කාලය වී ය. දෙපාර්තමේන්තුවේ බාල ම ලිපිකරු වූ මම, සැම විට ම කඩිසර ව කටයුතු කළෙමි. එක වැඩක් අවසාන කළ වහා ම මම තවත් පිටපතක් ලබා ගැනීමට වෙනත් මිනිසකු වෙත ගියෙමි. දෙපාර්තමේන්තුවේ උසස් කිරීම් අවස්ථාව

පැමිණි විට, මට උසස් වීමක් ලැබේ ද නො ලැබේ ද යන්න මම නොදත්තෙමි. එහෙත් මම මට ම මෙසේ කියා ගතිමි. ''නිකම් පලයන්, කලබල වෙන්න දෙයක් නෑ.'' මා සමර්ථ වුව හොත්, මගේ සහෝදර ජනතාව ගේ හිත සුව පිණිස වැඩ කිරීමට මම තීරණය කර ගතිමි. උසස් වීමක් ලබා ගැනීමෙන් පසු, දෙපාර්තමේන්තුවෙන් අස්වීම, වඩාත් ලොකු පරිත්‍යාගයක් වනු ඇත. මම ඉතා හොඳින් සමර්ථ වීමි.

1884 දෙසැම්බර් මාසයේ දී මදුරාසියට යන අතර, බ්ලැවට්ස්කි මැතිනිය සහ සෙන්පති ඕල්කට් තුමා කොළඹට පැමිණියෝ ය. මම මගේ පියා වෙතට ගොස්, ඔවුන් සමඟ මදුරාසියට ගොස්, ඔවුන් සමඟ වැඩ කිරීමට මට වුවමනා බව කීවෙමි. මුලින් ඔහු එයට කැමති වී ය. එහෙත් මා පිටත්වන දිනයේ දී තමා නරක සිහිනයක් දුටු බවත් එ හෙයින් යෑමට ඉඩ නොදිය හැකි බවත් ඔහු මට පැවසුවේ ය. නායක ස්වාමීන් වහන්සේ ද මා ළදරු කාලයේ සිට දන හැඳින සිටි වෙනත් ස්වාමීන් වහන්සේලා ද මගේ මුත්තා සහ ආත්තා ද සියල්ලෝ ම මගේ ගමනට විරුද්ධ වූහ. මෙහි දී මා කුමක් කළ යුතු දැයි නොදන සිටිය ද, මගේ සිත නම් මේ ගමන යා යුතු ම යැයි මට කී ය. බ්ලැවට්ස්කි මැතිනිය ස්වාමීන් වහන්සේලාට ද මගේ මුළු පවුලේ උදවියට ද මුහුණ දුන්නා ය. ධෛර්යයෙනුත් ආත්ම ශක්තියෙනුත් සියලු බාධක ඉවතට තල්ලු කර හැරියා වූ ඇ පුදුම අන්දමේ ගැහැනියකි. ඇ මෙසේ පැවසුවා ය. ''ඔබ ඒ දරුවාට යන්න ඉඩ නොදුන්නොත් ඔහු මැරේ වි. කොහොම වුණත් මම ඔහු රැගෙන යනවා.''

මෙ පරිද්දෙන් පවුලේ අය ගේ සිත දිනා ගනු ලැබී ය. මට ආශීර්වාද කළ මගේ මව මා යන විට මෙසේ කීවා ය. ''යන්න, ගිහින් මනුෂ්‍ය වර්ගයා වෙනුවෙන් වැඩ කරන්න.'' මගේ පියා මට මෙසේ කී ය. ''එහෙනම් යන්න, බෝධිසත්ත්ව කෙනෙක් වෙන්න උත්සාහ කරන්න.'' ඉක්බිති ව මගේ වැඩට ආධාර සඳහා ඔහු මට මුදල් දුන්නේ ය.

ඒ වන විට ද කොළඹ දී මම පරම විඥානාර්ථ සමාග මට බැඳී සිටියෙමි. සමාගම වෙනුවෙන් මම සය අවුරුද්දක් වැඩ කළෙමි. බ්ලැවට්ස්කි මැතිනියට ගුප්ත විද්‍යාවන්හි ගැඹුරු දැනුමක් තිබිණ. එ මෙන් ම ඈ හොඳ බෞද්ධ කාන්තාවක් ද වූවා ය. ඇය කළා වූ බොහෝ විශිෂ්ට දේවල් පිළිබඳ ව බොහෝ දෙනකුන් මගේ තරුණ කාලයේ දී මට පවසා තිබුණේ ය. මා කායික ව හා මානසික ව පවිත්‍ර වූයෙන් හිමාලයේ යෝගාවචරයන් හා එක් වන්නට මට පුළුවන් කම ඇතැයි වරක් ඈ මට කීවා ය. ඒ අනුව මම, මගේ දහ නව වියේ දී, මගේ මුළු ජීවිත කාලය ම ගුප්ත විද්‍යා හැදෑරීමට යෙදවීමට සිතා ගතිමි. එහෙත් මදුරාසියේ දී බ්ලැවට්ස්කි මැතිනිය මගේ ඒ වැඩ පිළිවෙළට විරුද්ධ වූවා ය. ''මනුෂ්‍ය වර්ගයා ගේ සේවය උදෙසා ඔබේ ජීවිතය කැප කිරීම ඊට වඩා වටී,'' යි ඈ පැවසුවා ය. ''මුලින් ම බුදුන් වහන්සේ ගේ ශුද්ධ ධර්මය ලියා තිබෙන පාලි භාෂාව ඉගෙන ගන්න.''

- මතු සම්බන්ධයි



# ළමා පෙළට මෙත් සූත්‍රයෙහි වෙසෙසි බව

"මුතු සීයා" විසිනි.

ආදරණීය දුවේ, පුතේ,

ඔබ අප නිතර දෙවේලේ ගෙදරදොරේ දී පිරිතක් වශයෙන් මෙත් සුතුර වඩනවා නේ ද? අප පුරුදු වෙලා සිටින්නේ එයට කරණීය මෙත්ත සූත්‍රය යි කියන්නයි. ඒ, එම සූත්‍රය 'කරණීයමත්ථකුසලේන....' කියා පටන් ගන්න නිසා. එහි මුල් දෙපදය රැගෙන හෝ නැති නම් 'මෙත්තං කරණීයං' (මෛත්‍රිය කළ යුතු ය) වශයෙන් ගෙන හෝ 'කරණීය මෙත්ත සූත්‍රය' කිය ව්‍යවහාර කරනවා යයි මට හිතෙන්නේ. ('කරණීයං + අත්ථ' යන පද දෙක සන්ධි වෙලා, එකතු වෙලා කරණීයමත්ථ කියා එක වචනයක් සෑදී තිබෙනවා. මෙහි "ම" යන්න පිටතින් ම ආපු අකුරක්. පෙළ වියරණෙහි එය හඳුන්වා දෙන්නේ ආගම වීමක් ලෙස. ඒ නිසා මෙම සූත්‍රයෙහි ආරම්භයේ දෙවැනි පදය වශයෙන් ඇති 'මත්ථ' යන්න 'මෙත්ත' යන වචනයට කිසි ම සම්බන්ධයක් නැති බව ඔබ මතක තියා ගන්න ඕනැ.) කෙසේ වුව ද කරණීයං අත්ථ කුසලේන යන පාලි පද තුනෙහි අරුත නම් 'දියුණුවෙහි (යහපතෙහි) දක්ෂ වන්නකු විසින් කළ යුතු' යන්නයි.

මෙත් සූතුරෙහි සඳහන් අදහස් ප්‍රධාන වශයෙන් කොටස් හතරකට වෙන් කළ හැකියි. මුලින් ඇති කොටස කෙළින් ම මෙත් වැඩීමට සම්බන්ධ නොවුවත් එහි පෙන්වා දෙන ගුණාංග මෛත්‍රී කරන්නකු තුළ මුල දී සිට ම තිබිය යුතු ගුණාංග හැටියට සැලකෙනවා. මෙත් වැඩීමට පමණක් නොව තම ජීවිතය ගිහියකු වශයෙන් හෝ පැවිද්දකු වශයෙන් හෝ යහපත් ලෙස සකස් කර ගන්නට කැමති, සකස් කර ගන්නට සූදානම් වන කවරකු විසින් කවර හෝ වැඩක ආරම්භයේ දී ඇති කර ගත යුතු ගුණාංග ලෙස මේවා දැක්විය හැකියි. සමාජයේ සෑම අයකු ම මෙම ගුණ ධර්මයන් ගෙන් යුක්තවීම ඉතා යෝග්‍ය වනවා ඇති. වැඩිහිටියනට පමණක් නොව කුඩා ඔබට පවා ඉගෙනීම් කටයුතු සාර්ථක කර ගැනීමටත් මේවා වැදගත් වෙනවා.

දෙවැනි කොටස (සුඛිනෝ වා ඛේමිනෝ හොන්තු ආදිය) නියමම මෙත් වැඩුමයි, මෛත්‍රී ප්‍රාර්ථනයයි. සැපවත් වූවෝ වෙත්වා, ආරක්ෂා සහිත වූවෝ හෝ වෙත්වා, සියලු සත්වයෝ සුවපත් වෙත්වා යනු වශයෙන් මෛත්‍රී සහගත ප්‍රාර්ථනාව යි. පසුව දැක්වෙන කිසිවෙකුට අකටයුත්තක් නොකිරීම, ද්වේෂ සහගත හැඟීම් ඇති කර නොගැනීම, අන් අයට දුකක් නොපැතීම, අන් අය හෙළා නොදැකීම ද මෙත් වැඩීමට ම අයත් වෙනවා.

තුන් වැනි කොටසින් මෛත්‍රී කළ යුත්තේ කවර සත්වයන් වෙත ද, මෙත් වැඩීමට භාජන විය යුත්තෝ කවුරු ද යන්න ඉතා ම විස්තරාත්මක ව දක්වා තිබෙනවා. ('තසා වා ථාවරා වා' යන්නේ සිට 'භූතා වා සම්භවේසී වා' දක්වා කොටසින්.)

හතර වැනි කොටසින් එසේ වැඩූ මෛත්‍රිය කවර ලෙසින් රැක ගත යුතු ද යන්න පැහැදිලි කර ඇත්තේ මෙසේයි. 'යම් සේ මවක තම එක ම පුතා තම ආයුෂ මෙන් රැක බලා ගන්නේ ද එසේ ම සියලු සතුන් කෙරෙහි මෙත් සිත පැතිරවිය යුතු ය.'

ඒ අනුව මේ සූත්‍රයේ මුල ඇති ගාථා තුනෙහි 'සක්කෝ' යන්නෙහි සිට 'උපවදෙය්‍යුං' යන පදය තෙක් මුල් කොටසෙහි සඳහන් ව තිබෙනවා තම යහපත අපේක්ෂා කරන්නකු, දියුණුවන්නකු තුළ (මෙහි දී මෛත්‍රී කරන්නකු තුළ මුලින් තිබිය යුතු) ගුණාංග පසළොසක්. ඒවා නම්: 1. සක්ක 2. උජු 3. සූජු 4. සුවච 5. මුදු 6. අනතිමානී 7. සන්තුස්සක 8. සුභර 9. අප්පකිච්ච 10. සල්ලහුකවුත්ති 11. සන්තින්ද්‍රිය 12. නිපක 13. අප්පගබ්භ 14. කුලේසු අනනුගිද්ධ 15. යේන විඤ්ඤූ පරේ උපවදෙය්‍යුං කිංචි ඛුද්දං න සමාචරේ යනු වශයෙනි.

ඒ අතුරින් සමාන ලක්ෂණ ඇති ගුණාංග හතරක් පමණක් මෙම ලිපියෙන් සාකච්ඡා කරන්න මා අදහස් කරනවා.

ඒ හතර තමයි,

1. සන්තුස්සක - ලද දෙයින් සතුටට පත්වීම
2. සුභර- අනවශ්‍ය බරින් තොර නිසා පෝෂණය කිරීමට (නඩත්තු කිරීමට) පහසු වීම
3. අප්පකිච්ච - කටයුතු කාර්යයන් අල්ප වීම, වැඩ අඩු කෙනකු වීම

4. සල්ලහුකවුත්ති- සැහැල්ලු වූ චාම් දිවි පැවැතුම් ඇත්තකු වීම, සැහැල්ලු ජීවිකා වෘත්තියක් - ජීවන රටාවක් පවත්වා ගෙන යෑම

එම ලක්‍ෂණ කෙටියෙන් දක්වනවා නම්, මෙහි පළමුවෙන් ම ඇති 'සන්තුස්සක' යන්නෙන් අදහස් කරන්නේ සතුටින් ප්‍රීතියෙන් විනෝදයෙන් සිටීම නොවේ. ඔබ අහලා ඇති කලියෙන් මහා මංගල සූත්‍රයෙහි 'සන්තුට්ඨී ච කතඤ්ඤුතා' සහ ධම්මපදයේ 204 වැනි ගාථාවේ 'සන්තුට්ඨී පරමං ධනං' යන මේ දෙපොළේ ම දක්වන ලද එක ම අදහස වන්නේ ලද දෙයින් සතුටු වීමයි. ඇස, කන, නාසය, දිව සහ සිරුර යන පසිඳුරන් සතුටු කිරීමෙහි පිණවීමෙහි සීමාවක් කෙළවරක් නැහැ. සමහර විට එය දුකකට පෙරළෙන්නට ද පුළුවන, ඒ නිසා දරුවනේ, සන්තුස්සක යන ගුණාංගයෙන් දැක්වෙනුයේ ඔබ අප කවුරුත් ආගම දහමේ දී පමණක් නොව සාමාන්‍ය සමාජයෙහි වුව වැඩිය යුතු ගුණාංගයෙක් වන ලද දෙයින් සතුටු වීමයි.

මෙහි දෙවැන්න වශයෙන් ඇත්තේ සුභර යන්නයි. එය සාමාන්‍ය වශයෙන් රැකීමට පහසු, සොයා බලා ගන්නට පහසු, වත්මන් බසින් කියනවා නම් නඩත්තු කිරීමට පහසු යන අරුත දෙයි. උපභෝග පරිභෝග වස්තු අඩු වීමයි. පක්ෂියකුට එක ගසකින් තවත් ගසකට නැතහොත් එක කැදැල්ලකින් තවත් කැදැල්ලකට පහසුවෙන් බරක් නැතිව පියාඹා යා හැකි සේ පහසුවෙන් පෝෂණය කළහැකි සේ ජීවත් වීම සුභර ගුණාංගය යි. භික්ෂූන් වහන්සේලා ගේ සුභර ජීවිතය ගැන යොදා ඇති උපමාව 'පක්ඛි සකුණො'ව' යන්නයි. එහි අරුත කුරුල්ලකු මෙන් යනු යි.

මෙහි දක්වා ඇති තෙවැනි ලක්ෂණය අප්පකිච්ච යන්නයි. එහි අරුත කටයුතු අඩු හෙවත් අල්ප යන්නයි. අප කවුරුත් පැහැදිලි ව දන්න කරුණක් තමයි බහුල ලෙස අපිළිවෙලින් කටයුතුවල යෙදෙන විට ඒවා අවුල් වන බව. එබැවින් වැඩි ආශාව නිසා කළ නොහැකි තරමට වැඩ පටලවා නොගෙන සිතට කයට විවේක ලබා ගත යුතු ය.

සිවුවැනි ලක්ෂණය සැහැල්ලු දිවිපෙවෙත යි. එය ද පෙර දක්වන ලද ගුණාංගයනට බෙහෙවින් ම ආසන්නයෙන් පවතී. ඉතා ම අවම වූ අවශ්‍යතාවන්ගෙන් සෑහීමට පත් වෙමින් බාහිර ආටෝපයෙන් තොර ව ජීවත්වීමයි. චාම් ලෙස ජීවිකාව පවත්වා ගෙන යාමයි.

කමටහන් ලබා ගෙන වනගත ව භාවනා කිරීමට සැරසුණු එක්තරා භික්ෂූන් වහන්සේ පිරිසකට එම වනයේ රුක්වලට අරක් ගෙන සිටි රුක් දෙවියන්ගෙන් කරදර පැමුණුණු විට උන්වහන්සේට ආරක්ෂාව සලසා ගැනීමට බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද්දකි මේ මෙත් සුතුර.

තෙරුවන් සරණයි !



# රත්තරන් දෝණි

**නදී අමා ජයසේකර මහත්මනිය**
**අධ්‍යාපනඥ - ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම**

සවස තේ බොන අතරේ තාත්තා යි, අම්මා යි, අමාදි යි නොයෙකුත් දේ කතා කළා.

"හැබැට අද මැයි මාසෙ තිස් එක් වැනි දා නේ ද? දෝණි අර කැලැන්ඩරයේ කොළය ගලවන්න කෝ."

අමාදි සීරුවට මැයි මාසෙ කොළය ගැලෙව්වා.

"ඔන්න ජූනි මාසෙ. අම්මාට යි තාත්තාට යි මතක ද ජූනි මාසෙ හුඟක් ම වැදගත් දෙයක් තියෙනවා?"

තාත්තා ටිකක් කල්පනා කළා. අම්මා කෝප්පවලට තේ වත් කරන අතරේ ආයෙමත් සැරයක් කැලැන්ඩරය දිහා බැලුවා.

අම්මා ගේ මුහුණේ හීන් සිනා රැල්ලක් නැගුණා.

"මොකක් ද මැණිකේ? මොකක් ද ඔය තරම් වැදගත් කාරණේ?"

අමාදි පාඩම් පොත ඇතුළේ තිබුණු පෑන අර ගෙන ජූනි 10 වටා රවුමක් ඇන්දා.

තාත්තා ගේ මුහුණේත් සිනා රැල්ලක් නැගුණේ අන්න එතකොට.

අමාදි තාත්තාට කිට්ටු වෙලා මලක් වාගෙ හිනා වුණා. තාත්තා අමාදි ගේ ඔලුව අත ගෑවා.

"ඒක නෙවෙයි මැණිකේ, අපි මේ වතාවේ දූ ගෙ උපන් දිනේ ජයට ම ගනිමු... මේ ජුනි දහ වැනිදාට අපේ කෙල්ලට අවුරුදු එකොළහක් නේ?"

"මාත් ඒක තමයි කල්පනා කළේ. හැම අවුරුද්දේ ම තෑග්ගක් දෙනවා මිසක් මොකවත් කරන්නෙ ම නැහැ නේ? මට මතක හැටියට අවුරුද්දක් පිරෙන උපන් දිනේට විතර යි, උත්සවයක් ගත්තේ."

"අපි කාඩ් එකකුත් ගහමු. හැබැයි දැන් ම ලෑස්ති වෙන්න වෙයි. තව දවස් දහය යි නෙව තියෙන්නේ."

අම්මා කෝප්ප ටික එකතු කරන ගමන් තාත්තාට පොඩි විහිළුවකුත් කරලා හිනා වුණා, මෙන්න මෙහෙම.

"ඔව්, ඔව්, ඔයාට ඉතින් බෝතල් ටිකකුත් ගන්න වෙලාව තියෙන්න එපා යැ?"

*  *  *

අමාදි පාඩම් කරන්න පොත් ටික අතට ගත්තේ කල්පනා කරමින්. බොහොම ලස්සනටත්, ඉක්මනටත්, පොත්වල වැඩ ටික ඉවර කරලා එයා මිදුලට බැස්සා. සුදු පූසි කකුල් දෙකේ පැටැලි පැටැලි අමාදිත් එක්ක ම ඇවිද්දා.

හැම දා මත් වාගේ අමාදි එදාත් උණ පඳුර යට ලෑලි බංකුවේ වාඩි වෙලා කුරුලු ලෑල්ල දිහා සතුටින් බලා සිටියා. හවස අමාදි ලෑල්ලේ තියාපු පැපොල් කෑල්ල කන්න මාල ගිරවෙක් ඇවිල්ලා.

එක පාරට ම සුදු පූසි කෙසෙල් ගහ මුලට පැන්නා.

"ආ, කැරපොත්තෙක් නේ ද?"

සුදු පූසි කැරපොත්තා අල්ලා ගන්න කලින් අමාදි පූසි ඇදලා ගත්තා. කැරපොත්තා හනි හනිකට කෙසෙල් ගසේ පිල්ලක් අස්සට රිංගුවා.

"මේ, අහු වෙන්න එපා හරි ද, සත්තු මරලා? ඔයාට මං බඩ පිරෙන්න ම කන්න දෙනවා නේ? ඔහොම ගියොත් නම් ඔයාට

කව දා වත් ම මේ සංසාරෙ ඉවරයක් කර ගන්න ලැබෙන්නේ නැහැ. මතක තියා ගන්න, හැම සතෙක් ම ජීවිතයට ආදරෙයි. ඔයා කැමැති ද කවුරු හරි ඔයා මරා ගෙන කනවාට? ඒ වාගෙ තමයි අනෙක් සතුනුත්. අඩු ගණනේ ඊළඟ භවයේ වත් මනුස්සයෙක් වෙන්න බලන්න...”

සුදු පූසි බොහොම හොඳට තේරුම් ගත්තා වාගේ “ඤාව්” කියලා අමාදි ගේ කකුල් දෙක ළඟ ගුලි වුණා.

ඉස්තෝප්පුවේ පත්තරය බලබලා හිටපු තාත්තාට හිනා ගියා. අම්මාත් මල් පාත්තියට වතුර දාන ගමන් තාත්තාට එකතු වුණා.

“දහම් පාසලේ හොඳ ම ශිෂ්‍යාවට දෙන තෑග්ග අපේ දෝණිට ලැබිච්ච එක හරියට ම හරි නේ ද මැණිකේ?”

“මොනවා කියනවා ද? අපේ දෝණි හොඳයි කියන කොට අපටත් කොච්චර නම්බුවක් ද?”

* * *

රාත්‍රී කෑම කන වෙලාවේ තාත්තා අමාදි දිහා පරිස්සමට බැලුවා.

“දෝණි මොකක්දෝ ලොකු කල්පනාවක වාගෙයි.”

“ඔව් තාත්තේ, මං මේ කල්පනා කළේ මගේ උපන්දින උත්සවය ගැන.”

“ඕක ඉතින් ඔයා ඔය හැටි කල්පනා කරන්න දෙයක් යැ? දැන් තාත්තා කිව්වා නේ උත්සවේ ජයට ම ගන්නවා කියලා. අපි හෙට යමු හොඳ ලස්සන ඇඳුමක් ගන්න.”

“ඔව් ඔයාට ආස ම ආස ඇඳුමක් ගනිමු. ඔන්න මැණිකේ ආයෙ සැරින් සැරේ රස්තියාදු වෙන්න බැහැ, සපත්තු ජෝඩුවේ ඉඳලා ම ඔක්කෝම දේවල් එක පාරට ම අරන් එන්න.”

අමාදි ටිකක් කල්පනා කළා.

"ම්... මං හිතුවේ මගේ උපන් දින උත්සවය වෙනත් විදියකට කරන්න... ඒ කියන්නේ මං ආස විදියකට..."

අම්මා යි, තාත්තා යි, පුදුම වෙලා බලා හිටියා. දෙන්නා ම මුහුණට මුහුණ බලා ගත්තා.

"ඉතින් දෝණි ආස මොන විදියේ උත්සවයකට ද?"

"අම්මලා කියනවාට වඩා සාමකාමී අර්ථවත් උත්සවයක්..."

තාත්තා අම්මා දිහා බලලා හිනා වුණා.

"ඒකත් එකට ම දහම් පාසලේ ළමයි එකතු කර ගෙන කරන උත්සවයක් ද දන්නේ නැහැ."

කෑම ටික ඉවර වුණු පිඟාන සෝදලා රාක්කයේ තියලා අමාදි ආයෙමත් පුටුවේ ඉඳ ගත්තා.

"මට හිතෙනවා මගේ උපන් දිනයට පොඩි හාමුදුරුවන්ට කියලා බණක් දේශනා කරවන්න."

අම්මාත්, තාත්තාත්, කිසි ම දෙයක් කතා කළේ නැහැ. අමාදි කියන දේ අහ ගෙන හිටියා.

"මගේ උපන් දින තෑග්ග මට කල් තියා අර ගෙන දෙන්න."

"මොකක් ද දෝණිට ඕනෑ?"

"මට ඕනෑ සිංහලෙන් පළ කරපු සූත්‍ර පිටකයට අයත් පොත් ටික."

අම්මා යි, තාත්තා යි, නැවතත් මුහුණට මුහුණ බලා ගත්තා.

"ඉතින් ඔයාට පුළුවන් ද දෝණි ත්‍රිපිටකයේ තියෙන දේවල් කියවලා තේරුම් ගන්න?"

"අපොයි ඔව්, මට තේරුම් ගන්න පුළුවන්. මං දහම් පාසලේ පුස්තකාලයේ දී කියවලා බැලුවා. මුලින් මුලින් කියවන කොට හිතුණේ අමාරු යි කියලා තමයි. ඒ වුණාට ටිකක් කියවා ගෙන යද්දි ඒ රටාවට හුරු වුණා. ඊට පස්සේ තේරුම් ගන්න පුළුවන් වුණා."

එ දා රෑ අමාදි නින්දට ගියාට පස්සේ අම්මා යි, තාත්තා යි, ගොඩක් වෙලා කතා කළේ අමාදි ගෙ යෝජනාව ගැන.

"ඇත්තට ම මැණිකේ මටත් හරි ම ආසාවක් තියෙනවා ඔය සූත්‍ර පිටකය කියවන්න... බලන්න බෞද්ධයන් වෙලාත් අපි බුදුන් වහන්සේ ගේ මේ ධර්මය කියවලා නැහැ නේ?"

"ගිය ඉරිදා දහම් පාසල් ගිහින් ඇවිත් දෝණි පැයක් විතර තිස්සේ මට කිව්වා, අලගද්දූපම සූත්‍රය ගැන... මාත් එදා තමයි ඒක ඉගෙන ගත්තේ. මං දෝණිත් එක්කත් එදා කිව්වා, මටත් හරි ම ආසයි කියලා මුළු සූත්‍ර පිටකය ම කියවලා බලන්න කියලා. ඇත්තට ම ඒවා අහන කොට ධර්මය ගැන පුදුම පැහැදීමක් ඇති වෙනවා."

"මට වෙලාවකට හිතෙනවා මැණිකේ අපේ දරුවා ධර්මයෙන් අපට වඩා ඉදිරියෙන් ඉන්නවා කියලා."

"ඇත්ත තමයි, මේ දරුවා අපේ පිනට ම අපේ ළඟ ඉපදුණු දරුවෙක්."

* * *

පසු දා උදේ ම අමාදිත් එක්ක අම්මා යි, තාත්තා යි, දෙන්නා ම ගියා නායක ස්වාමීන් වහන්සේ බැහැ දකින්න. අමාදි ම යි පිරිකරක් තෝරා ගත්තේ.

"අම්මේ, අපි විදුලිය පිරිමහන බල්බ් කීපයක් අර ගෙන යමු. ඒක පන්සලකට හරි ම ප්‍රයෝජනවත්. ඒ වාගේ බල්බ් කොච්චර තිබුණත් පන්සලකට වැඩි වෙන්නේ නැහැ..."

තුන් දෙනා ම බොහොම තැන්පත් ව පුංචි බංකුවේ වාඩි වුණා. අමාදි තමයි කතා කළේ.

"ස්වාමීන් වහන්ස, ජුනි දහ වැනි දා තමයි මගේ උපන් දිනේ. ඉතින් අපි කල්පනා කළේ බණක් කියවන්න... ඔබ වහන්සේ ගෙන් අවසර ලැබෙනවා නම් දහම් පාසලේ අපේ පුංචි පන්තිවලට උගන්වන පොඩි හාමුදුරුවන්ට කියලා ඒ බණ දේශනය කර ගන්න..."

නායක ස්වාමින් වහන්සේ ගේ තැන්පත් ශ්‍රද්ධාවන්ත මුහුණ මහා ආලෝකයකින් පිරී ගියා වාගෙ යි, අමාදි දැක්කේ. හැමෝ ම පහන් සිතින් බලා සිටියා, උන් වහන්සේ ගේ අදහස දැන ගන්න.

"සාදු, සාදු, සාදු, බොහොම අගෙයි, බොහොම අගෙයි. පින්වන්ත දරුවෝ වැඩ කරන්නේ එහෙම තමයි. සාදයක් පවත්වලා කාලා බීලා නටලා සතුටු වෙනවාට වඩා තමා ගේ සමාජය දහමින් පෝෂණය කරනවා කියන්නේ මහා උතුම් සත්කාරයක්. දැන් මේ දියණියට කොහොම ද මේ වාගේ අදහසක් පහළ වුණේ.., දෙමාපියන් කියලා ද?"

අමාදි තාත්තා දිහා බලලා හිනා වුණා.

"අපොයි නැහැ ස්වාමින් වහන්ස, මේක අපේ දෝණි ගේ ම අදහසක්. ඇත්තට ම අපි නම් සූදානම් වුණේ ලොකු සාදයක් පවත්වන්න. දෝණි ම මේ ගැන කියන්න කෝ."

"ස්වාමින් වහන්ස, කෙනකුට කරන්න පුළුවන් උතුම් ම දානය, ධර්ම දානය නේ? එක දහම් පදයක් හරි දන් දෙන කෙනා සැබෑ කල්‍යාණ මිත්‍රයෙක්. ඒ පින්කම කරලා මං මගේ මේ උපන් දිනේට හැමෝට ම කලණ මිතුරියක් වෙනවා."

නායක ස්වාමින් වහන්සේ මඳ සිනහවකින් යුතු ව තැන්පත් ව හිස සලන ගමන් ආවාසයේ ඉහළින් වැඩ සිටි පිළිම වහන්සේ දිහා බැලුවා. අමාදිට පෙනුණේ බුදුන් වහන්සේ ගේ මහා කරුණාවෙන් යුතු දෑස අමාදි වෙතට ම යොමු වෙලා තියෙනවා වාගෙ යි.

අම්මා තමයි ඊ ළඟට කතා කළේ.

"ඔබ වහන්සේට කියන්න තවත් කාරණයක් තියෙනවා, මේ වතාවේ අපේ දෝණි අපෙන් බොහොම හොඳ තෑග්ගකුත් ඉල්ලුවා නේ? අපි දැන් අද ම ඒකත් අරන් දෙනවා."

"හැබෑට? කියමු බලන්න මොකක් ද කියලා... අපටත් දැන ගන්න."

අමාදි තමන් ඉල්ලපු තෑග්ග ගැන පැවසුවා. නායක ස්වාමීන් වහන්සේ ඒ ගැන බොහොම සතුටු වුණා.

කාටත් එන්න පහසු විදියට ජුනි දහ වැනි දා සවස් වරුවේ පන්සලේ දී බණ දේශනය පවත්වන්නට යොදා ගත්තා.

එ දා අම්මාත්, තාත්තාත්, අමාදිට සූත්‍ර පිටකයේ පොත් කට්ටලය අර ගෙන දුන්නේ හරි ම ශ්‍රද්ධාවෙන්. බෞද්ධ මන්දිරයේ සිටි පිරිස මේ වාගේ ළමයෙක් එවැනි තෑග්ගක් ඉල්ලීම ගැන පුදුම වෙලා බලා හිටියා. එ තැන වැඩ සිටි ස්වාමීන් වහන්සේලාත්, මහ සතුටකිනුයි කතා කළේ.

"ඕවා පුදුම වෙන්න දේවල් නෙවෙයි, සංසාරේ පුරුදු... පෙර කුසල්... නැත්නම් කොහොම ද ඔය වාගේ දේකට හිත දෙන්නේ?"

* * *

අමාදි එදා සවස තාත්තාට ලස්සන පුංචි දහම් පොතක් පෙන්නුවා.

"තාත්තේ, මෙන්න මේ දහම් පොතෙනුත් මට පිටපත් සීයක් විතර ගන්න ඕනෑ. මං හිතා ගෙන ඉන්නේ බණ අහලා ඉවර වුණා ම හැමෝට ම මේ පොතකුත් තෑගි දෙන්න යි."

තාත්තා පොතේ නම බැලුවා. 'සෝවාන් වනු වස්... !'

අම්මාත්, තාත්තාත්, එක හුස්මට පොත කියවා ගෙන කියවා ගෙන ගියා.

"හැබෑ අපූරු පොතක් නේ? මේ පොත බැලුවා ම යි මට හිතුණේ සෝවාන් වෙන එක අපටත් කරන්න පුළුවන් දෙයක් කියලා."

අම්මා ගේ අදහසට අනුව බණ අහන්නට එන පිරිසට හොඳ කෑම පාර්සලයකුත් පරිත්‍යාග කරන්න යොදා ගත්තා.

* * *

ජුනි දහ වැනි දාට හිරු උදා වුණා.

උදේ පාන්දර හතරට අම්මා යි, තාත්තා යි, අවදි වෙන කොට ම අමාදි බරට බරේ මහ විසාල පාර්සලයක් අම්මාට යි, තාත්තාට යි, දීලා වැන්දා. ඒ පාර්සලයේ තිබුණේ එදා අමාදිට අර ගෙන දීපු සූත්‍ර පිටකයේ පොත් කට්ටලය!

ඇස් අදහා ගන්න බැරුව අම්මා යි, තාත්තා යි, බලා සිටියා. දෙන්නා ම පාර්සලය උඩ තිබුණු ලා රෝස පාට රමණීය සුබ පැතුමේ රත්තරන් පාට වචන පෙළ කියෙව්වා.

'මට හිතෙන විදියට

දරුවකු උපන් දිනයක දී කළ යුත්තේ

තමාට මෙ වැනි වටිනා මිනිස් භවයක් ලබා දුන්

අම්මාටත්, තාත්තාටත්,

තෑග්ගක් දීම යි.

ඉතින්...

මීට වසර එකොළහකට පෙර,

ජුනි දහ වැනි දිනෙක

මට මේ මිනිස් භවය ලබා දුන්

මගේ ආදරණීය අම්මාටත්, තාත්තාටත්...

මේ මහා දහම් දානය පූජා වේ වා!

මිනිස් භවයක් ලැබීම තරම් ලාභයක්

වෙන නම් නැහැ.

මට මේ ලාභය ලබා දීමේ දී

මගේ ආදරණීය අම්මාත්, තාත්තාත්

තමන් ගේ භව ගමනේ පමා වුණා.

ඒත්...

මා ඉපදුණු එක ගැන අම්මාත්, තාත්තාත් සතුටු වෙන්න.

මට ලැබුණු මේ මිනිස් භවය තුළ

අඩු තරමින් සෝවාන් ඵලයට වත් යන්නට

මා අධිෂ්ඨාන කර ගෙන ඉන්නවා.

මා වෙනුවෙන් කළ මේ මහා කැපවීමට

කිසි දාකත් මට ණය ගෙවලා ඉවර කරන්න බැහැ.

ඒ ණයෙන් ටිකක් හෝ ගෙවන්නට

මගේ අම්මාත්, තාත්තාත්,

ධර්ම මාර්ගයේ රැගෙන යන්න යි, මගේ මේ උත්සාහය.

ආදරණීය අම්මේ,

අද සිට කුඹියකු - කැරපොත්තකු වත් මරන්න එපා.

ආදරණීය තාත්තේ,

මත් පැන් බොන්න වත්, බොන අයට අනුබල දෙන්න වත්, එපා.

ඒ උපන් දින තෑග්ග මට දෙන්න.

දෝණි

අම්මාත්, තාත්තාත්, අමාදි තුරුළු කර ගත්තා.

* * *

සවස් වරුවේ පන්සලට යන්න යොදා ගෙන තියෙන නිසා අමාදි උදේ පාන්දර ම මල් ගස්වලට වතුර දැම්මා. ඊට පස්සේ මිදුල අතු ගෑවා. ගරාජය ළඟ ඉදල හේත්තු කරලා මල් බාල්දියත් එතැන ම තැබුවා.

"ආ, මේ මොකක් ද, මොනවා දෝ පුරවාපු ලොකු ගෝනි දෙකක්... ඊයේ හවස මේ ගෝනි දෙක තිබුණේ නැහැ නේ?"

අමාදි ටිකක් කිට්ටු වෙලා බැලුවා.

තාත්තා අවුරුදු ගණනාවක් තිස්සේ එකතු කරලා බිත්ති අල්මාරියේ ලස්සනට අහුරලා තිබුණු විසිතුරු හිස් මත්පැන් බෝතල් ටික... රත්තරන් පාට කැටයම්... වර්ණවත් ලේබල්... එක එක හැඩ... මේ ඔක්කෝම බෝතල් ගෝනි දෙකක අසුරලා ගරාජය මුල්ලේ ගොඩ ගහලා.

අමාදි නිහඬ ව ම ආපසු හැරුණා.

"ආ, කැරපොත්තන්ට යි, කුඹින්ට යි, ඉසින කෘමිනාශක බෙහෙත් බෝතල් ටිකත් තළලා දාලා."

කුස්සියට ඇතුළු වන තැන පුංචි කාණුවේ මූඩි ඉවත් කරපු තවත් මත්පැන් බෝතල් දහයක් විතර මුනින් අතට හරවලා.

"හානේ, මේ අලුතින් ම තාත්තාට ලැබුණු බෝතල් ටික නේ ද?"

අමාදි ගෙට ගොඩ වුණා.

එයා ඉස්සෙල්ලා ම ගියේ බිත්ති අල්මාරිය ළඟට...

අමාදි ගේ මුහුණේ මලක් පිපුණා.

"හරි ලස්සන යි..."

බිත්ති අල්මාරියේ බොහොම පිළිවෙළට සූත්‍ර පිටකයේ පොත් කට්ටලය අසුරලා තිබුණා.

"කෝ අම්මා යි, තාත්තා යි? කිසි ම සද්දයක් නැහැ නේ?"

අමාදි ඉස්තෝප්පුව දිහා බැලුවා.

අම්මා යි, තාත්තා යි, හාන්සි පුටු දෙකේ වාඩි වෙලා අමාදි තෑගි දීපු පොත් දෙකක් කියවනවා.

- නිමි. -



# මහින්දගමනයෙන් ආලෝකවත් වූ අපේ රට


**විමුක්ති පුස්වේවල**

**රාජකීය විදුහල, 10 වන ශ්‍රේණිය**


පොසොන් පොහොය අපට වැදගත් වන්නේ මිහිඳු හිමියන් ගේ වැඩමවීමත් සමඟ ශ්‍රී ලංකාවේ උතුම් වූ බුදු දහම පිහිටුවීම නිසා ය.

ක්‍රි.පූ. 237 දී පොසොන් පොහොය ද මිහිඳු මාහිමියන් වහන්සේ දඩ කෙළියේ යෙදී සිටි දේවානම්පියතිස්ස රජතුමා මිහින්තලා පව්වේ දී බෞද්ධයකු බවට පත් කළ සේක. මිහිඳු හිමියන්ගෙන් බණ ඇසූ රජතුමා මහමෙවුනා උයන මහසඟ රුවනට පූජා කළේ ය. මිහිඳු හිමියන් දේශනා කළ ධර්මය අසා ලක්දිව විවිධ ආගම් ඇදහූ බොහෝ දෙනා බෞද්ධයෝ වූහ. මහින්දගමනයට පෙර ලක්දිව ජනයා නාග, යක්ෂ, දේව යනුවෙන් ගෝත්‍රවලට වෙන් වී විවිධ ඇදහිලි ඇතිව සිටි අතර මහින්දගමනයත් සමඟ එකම ජන කොට්ඨාසයක් ලෙස එක් රොක් විය. එම ජනයා තුළ පෙර නොතිබූ ගුණ ධර්මයන් ලියලන්නට විය. සතුන් මරාගෙන කෑම වෙනුවට සතුන්ට කරුණාවන්ත වීම සහ සටන් කිරීම වෙනුවට සමඟි වීමට හුරු විය.

එපමණක් ද නොව ශ්‍රී ලංකාවේ ආර්ථික, සාමාජික, දේශපාලනික සහ සංස්කෘතික යන හැම අංශයන්හි උසස් වූ වෙනස් කම් සිදු විය. ලංකාවේ අක්ෂර කලාව ආරම්භ වූයේ ද

මහින්දගමනයෙන් පසුවයි. එම නිසා දිනෙන් දින එහි වර්ධනයක් ද සිදු විය.

ශ්‍රී ලංකාව මහින්දාගමනය නිසා සශ්‍රීක ව වගා කළ හැකි බිමක් විය. එසේ සිදු වූයේ මහින්දගමනයෙන් පසු සිදු වූ සංඝමිත්තා තෙරණිය 18 කුලයක ශිල්පීන් සමඟ මෙරටට වැඩම වීමෙන් පසුවයි. එම ශිල්පීන් අතර, වාරි කර්මාන්තය, කුඹල් කර්මාන්තය, බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පය, බිතු සිතුවම්, චිත්‍ර කලාව, කැටයම් ආදිය දන්නා ඒ ඒ කුලයන්ට අයත් ශිල්පීහු වූහ. එම නිසා අපේ වාරි ශිෂ්ටාචාරයක් ගොඩ නැගුණි. මහින්දග මනය සිද්ධ නොවන්නට ශ්‍රී ලංකාව වියළි කර්කශ වූ මුඩු බිමක් ව පවතිනවා නො අනුමානය. මෙසේ සිදු වූ මහින්දගමනය නිසා අපේ රටේ විශාල වැව් ඉදි විය. කලා වැව, පරාක්‍රම සමුද්‍රය, තිසා වැව වැනි විශාල වැව් මහින්දගමනයේ ප්‍රතිඵලයක් ලෙස පසු කාලයේ ඇති වූ ඒවා විය. එම නිසා අපේ රටේ ගොවි ජනතාවට එමඟින් මහත් සෙතක් සැලැසිණි. එම වැව් ඉදි කිරීමේ දී යොදා ගෙන ඇති තාක්ෂණය පිළිබඳ බටහිර උගතුන් විස්මයට පත් කරවයි. වැව් බැම්ම රළ පහරින් සේදීයාම වැළැක්වීමට යොදා ඇති රළපනාව, ඒ වගේම සොරොච්ච, බිසෝ කොටුව, පිටවාන, ඇතුල්වාන, ඉස්වැටි, කදගු බැමි, කුළුවැව් එම තාක්ෂණයට කදිම නිදසුන් ය. මේ නිසා වැවයි, දගැබයි, කෙතයි යන අපේම සංස්කෘතියේ ආරම්භය සිදුවූයේ මහින්දගමනයෙන් පසුවයි.

මේ හේතු කාරණා නිසා මහින්දගමනයෙන් අපේ රට ආලෝකවත් වූ බව අමුතුවෙන් කිව යුතු නොවේ. ශ්‍රී ලංකාවේ වාසය කරන අපගේ යුතුකම වන්නේ මහින්දගමනයෙන් අපට ලැබුණු උතුම් වූ බුදු දහම සහ විවිධ ශිල්ප ශාස්ත්‍ර ආරක්ෂා කර ගෙන අපේ රට ආර්ථිකයෙනුත් සදාචාරයෙනුත් තවත් දියුණු කර ගැනීමයි.



POSON MOON SHINES BRIGHTLY OVER THE MOUNTAIN PEAK, MISSAKA

# KING OF LANKA MEETS THERA MAHINDA

Compiled by:
Srima Warusawithana

Oh! King of Blessed Lanka – thrice hallowed by the presence of the Buddha
I come – not as a prince in regal dress – the son of mighty Emperor Asoka,
But as a disciple of the King of the Dhamma – "Dhammarājassa sāvakā"
Mahā Samana Gautama – the Supreme Buddha;
The all-knowing one, of perfect loving kindness, of perfect compassion,
Of perfect wisdom:
Out of compassion for you the King, and all beings in this your kingdom,
The lovely land where good people live;
I bring this message of the Dhamma and with it a rich and vibrant culture.
Thera Mahinda thought thus: "Is the King of Lanka – beloved of the devas,
Devānampiyatissa – my father's friend ;
Is he wise and keen enough to understand and absorb
The teaching of my Lord Gautama Buddha
Three simple questions shall I ask the King – the ruler of this land."
"What tree is this?' 'It is a mango tree; '
'Are there other mango trees besides this tree…?'
'Oh, there are plenty mango trees Venerable Sir,'
'Are there other trees besides those mango trees?'
'There are of course plenty other trees.'
'Are there any other trees besides these trees and those other trees?'
'Well Venerable Sir, there is this mango tree."
The great Thera soon assessed the wisdom of the King,
Ready and eager to listen and learn,
The Buddha's gentle teachings,
It touched the heartstrings of the King and all the people of Lanka,
Preserved and practiced, the Buddha's message holds way
Upon our Motherland, a grateful tribute to Maha Thera Mahinda.
The rich gift of Truth, an enduring gift like no other.